GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

26.04.2014

මාධ්‍ය නිවේදනයයි.

වින්නඹු මාතාවන් සේවයෙන් පලවා හැරීම තුලින් රෝහල් සුතිකාගාර තුළ ඇතිවී ඇති අනතුරුදායක තත්ත්වය.

රජයේ රෝහල්වල සුතිකාගාර සේවය සම්බන්ධයෙන් හෙදියන් සහ වින්නඹු මාතාවන් අතර ඇතිවූ බරපතල ගැටුම හේතුවෙන් මව්වරුන් සහ නව ජන්මය ලබන ළදරුවන් දැඩි අනතුරකට පත්ව ඇත. වින්නඹු මාතාවන් හෙද පුහුණු පාසල්වල පුහුණුව ලබන කාලයේ සිටම දැඩි මානව හිමිකම් උල්ලංඝනයකට ලක්වන බවත්, සේවා ගරුත්වය රැකගෙන කටයුතු කිරීමට අවස්ථාව නොලැබෙන බවත් පැවසේ. මේ පසුබිම තුළ ඇතිවූ වින්නඹු මාතාවන්ගේ වෘත්තිය අරගලයෙන් අනතුරුව ඇතැම් රෝහල් වලදී වින්නඹු මාතාවන් හට සිදු වූ බැන වැදීම් , තර්ජනය කිරීම්, සුතිකාගාර උපකරණ පැහැර ගැනීම් හා ඔවුන් පළවා හැරීම් යන සිදුවීම් ගණනාවක් මේ වන විටත් වාර්තා වී ඇත. ඒ හේතුවෙන් සුතිකාගාර කටයුතු දැඩි අනතුරු දායක තත්ත්වයකට පත්ව ඇති අතර ස්ථාන ගණනාවක වින්නඹු මාතාවන්ගේ සේවය ලබා ගැනීමෙන් තොරව කරන ලද ඇතැම් ප්‍රසූත සංකූලතා බහුලවීම නිසා ගැටුම් වලට මැදිවූ මව්වරුන් සහ ලදරුවන් දැඩි සත්කාර ඒකක වෙත ඇතුළත් කිරීමට පවා සිදුවී ඇත.

හෙදියන් සහ විනන්ඹු මාතාවන් අතර ඇතිවූ මෙම වෘත්තිය අරගලයේදී වෛද්‍යවරුන් කොටස් කරුවන් නොවේ. එහෙත් රෝගී සත්කාර සේවාවේ අවසාන වගකීම වෛද්‍යවරුන් වන අප වෙත පැවරී ඇති හෙයින් මෙම ගැටලුව විසඳීම සඳහා වූ අපගේ යෝජනා මේ වන විටත් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලබාදී ඇත. තවදුරටත් කල්මැරීමක් සිදු නොකොට මෙම වෘත්තිය ගැටුම් අවසන් කර, ආරක්ෂාකාරී සුතිකාගාර සේවාවක් ජනතාවට ලබා දීමට ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා ඇතුලුව සෞඛ්‍ය අමාත්‍යාංශයත්, අවසාන වශයෙන් ජනතා සුවසෙත පිණිස කටයුතු කරන රජයත් නොපමාව පියවර ගත යුතුය. මෙම ගැටුම 29.04.2014 දින වන විට විසඳීමට සෞඛ්‍ය බලධාරීන් පියවර ගත යුතුය. එසේ නොවුනහොත් ගැබිනි මව්වරුන්ගේ සහ එම දරුවන්ගේ ජීවිත අනතුරේ හෙලිය නොහැකි නිසා එම ඒකක වසා දැමීමටත් මෙම අනාරක්ෂිත සුතිකාගාරවලින් මව්වරුන් සුරක්ෂිත වෙනත් ස්ථානවලට යොමු කිරීමටත් සිදුවනු ඇත.

ස්තුතියි

වෛද්‍ය සුමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර:

වෛද්‍ය නවීන්ද සොයිසා	0718582444
වෛද්‍ය නලින්ද හේරත්	0717876516